# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1798/9 — 2013 පෙබරවාරි මස 18 වැනි සඳුදා - 2013.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### උතුරු මැද පළාතේ පළාත් සභාව

උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ අංක 32(1) වගන්තිය යටතේ, උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කරුණාරත්න දිවුල්ගනේ වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත නම් සඳහන් නිලධාරීන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ඒ ඒ තනතුරු සඳහා පත් කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ, කේ. බී. හෙට්ටිආරච්චි මහතා 2013.01.09 දින සිට නැවත නියමයක් කරන තුරු, උතුරු මැද පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත, පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්,

02. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I පන්තියේ පී. බී. දයාරත්න මහතා 2010.07.01 දින සිට නැවත නියමයන් කරන තුරු උතුරු මැද පළාත් සැළසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැළසුම්) වශයෙන් (2012.01.03 දිනැති අංක 1739/8 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* අනු අංක (05) සංශෝධනය කිරීම)

03. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ, ඩබ්. ටී. ඒ. මානෙල් මහත්මිය 2013.02.14 දින සිට නැවත නියමක් කරන තුරු, උතුරු මැද පළාත් පාලන කොමසාරිස් වශයෙන්,

04. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ, එම්. ජී. එන්. දිල්රුක්ෂි මහත්මිය 2013.02.14 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා,

05. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ, ආර්. එම්. කේ. ආර්. බී. රත්නායක මහතා දැනට දරන තනතුරේ රාජකාරි කටයුතුවලට අමතරව, 2013.01.16 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා.

කරුණාරත්න දිවුල්ගනේ,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර.

2013 පෙබරවාරි මස 14 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

03 - 290

1A - PG 001564 — 340 (2013/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*